# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.04.19 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ තිස් හත් වන (37) සභා වාරය 2021.04.19 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී. චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයසීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි | - | ඩබ්.එන්.පී.චන්ද්‍රපාල මිය |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව පසුගිය සභා රැස්වීම් අවස්ථාවේදී පොතුවිල් පාර සභාව සතු පර්චස් 03 ක භූමි ප්‍රමාණය සම්බන්ධව සිදු කරන ලද සාකච්ඡාවේදී තමන් සමග එවකට ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ලද මන්ත්‍රිවරුන් 08 දෙනකු සිටි අතර, තමන් ඇතුළු 05 දෙනකු එකතු වී නඩු කියා මෙම භූමි ප්‍රමාණය

බේරා ගැනීමට හැකිවූ අතර, මෙම භූමිය සඳහා එදා සභාව මගින් ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක නොකිරිම සම්බන්ධයෙන් දැඩි කනගාටුව ප්‍රකාශ කර සිටින බවට තමන් විසින් කරන ලද ප්‍රකාශයත්, ඒ වගේ ම පසුගිය රැස්වීම් වාරයේදී සමුපකාර සම්බන්ධව කරන ලද සාකච්ඡාවේදී පසුගිය කාලයේදී තරාදිවලට හා හිස් රාක්කවලට පමණක් සීමාවී තිබූ සමුපකාර ව්‍යාපාරය ගරු මහින්ද රාජපක්ෂ ආණ්ඩු සමයේදී මෙසේ වැටී තිබූ සමුපකාරයන් කෝප් සිටි බවට පත් කර නගා සිටුවීමට ඉතා සාර්ථකව කටයුතු කළ බවටත් තමන් කළ ප්‍රකාශ ඇතුළත්ව පසුගිය සභා වාර්තාව සංශෝධනය විය යුතු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉන් අනතුරුව වෙනත් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන්, සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

නැත

## 03. <u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

**ඉදිරිපත් වී නොමැත**

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

නැත

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

### 5.1. <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**යෝජනා අංක 01**

මොනරාගල, නව බස් නැවතුම්පොළ කඩ කාමර 22 මේ වන විට 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ටෙන්ඩර් කර බඳුකරුවන් වෙත ලබාදී ඇත. එහිදී ටෙන්ඩර් කොන්දේසිවලට යටත්ව මෙම කඩ කාමරවලට අදාළ ප්‍රධාන මුදලින් 25% ක ප්‍රමාණය දින 07 ක් ඇතුළත ද ඉතිරි මුදල් 2020.12.25 දිනට පෙර ගෙවා අවසන් කරන ලෙස ද බඳුකරුවන් වෙත ටෙන්ඩර් ප්‍රධාන ලිපිය හරහා දැනුම් දී ඇත. තව ද මෙම දිනය වන විට ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති බඳුකරුවන් සඳහා දින 14 ක් ඇතුළත මෙම මුදල් ගෙවා අවසන් කරන ලෙස ද 2021.02.01 දිනැති ලිපිය මගින් ද දන්වා යවා ඇතත්, මේ වන විටත් ඇතැම් බඳුකරුවන් මෙම ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති අතර, එම බඳුකරුවන් සම්බන්ධව ඉදිරි කටයුතු කිරිම සඳහා මහ සභාවේ තීරණය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙතෙක් මුදල් ගෙවා නොමැති බදුකරුවන් සිටී නම් ලිඛිතව ඔවුන් දැනුවත් කර මෙම මස අවසන් වීමට පෙර කඩිනමින් අදාළ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමත් එම කාල සීමාවට පසුවත් නොගෙවන බදුකරුවන් සම්බන්ධව ඉදිරියේදී සභා තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාවේ බහුතරයක් දෙනා තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල නව තොග පොළ භූමියේ කඩ කාමර බදුගත් බදුකරුවන් විසින් කඩ කාමරවලට අදාළ ප්‍රධාන මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා අවසන් කර නොමැති බැවින්, 2020.06.09 වන දින බදුකරුවන් සමග පවත්වන ලද සාකච්ඡාවෙන් අනතුරුව මෙම හිඟ මුදල් ගෙවීම සඳහා මාස 10 ක සහන කාලයක් ලබා දෙන ලදී. ඒ සම්බන්ධව 2020.06.12 වන මහ සභා දින මෙම සහන කාලය සඳහා 2020 ජුනි මස සිට ඉදිරියට මාස 10 ක සහන කාලයක් ලබාදුන් අතර, එම කාල සීමාව තුළ මුදල් ගෙවා අවසන් නොකරන අයගේ දේපල නැවත සභාවට පවරා ගන්නා බවට තීරණය වුවත් එම සහන කාලය ද මේ වන විට අවසන් ව පවතින බැවින්, ඒ සම්බන්ධයෙන් මහ සභාවේ තීරණය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටි අතර, පසුගිය මස මහ සභාවේ සාකච්ඡා කරන ලද නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ට අදාළව සභිකවරුන් විසින් ඉල්ලා සිටි ලිපි සහ අදාළ චක්‍රලේඛ මේ වන විට සෑම සභිකවරයෙකුට ම ලබාදී ඇති බැවින් ඒ සම්බන්ධව ද මේ මොහොතේ තීරණයක් ගනිමු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

මෙම ලිපි සම්බන්ධව අවධානය යොමු කිරීමේදී ආයතනය විසින් යවන ලද සභා තීරණය පැහැදිලි නැති බවත්, නැවත ඒ සඳහා සභාවේ තීරණයක් ගන්නා ලෙස කොමසාරිස්තුමන් දැනුම් දී ඇති බව වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රාදේශීය සභාවට විශාල ආදායමක් නොමැති නිසා මෙම කඩ කාමර 16 ටෙන්ඩර් කර සභාවට ආදායමක් ලබා ගත යුතු අතර, මෙම චක්‍රලේඛනය හා ලිපිවලට අදාළව බදුල්ල කොමසාරිස්තුමන්ගෙන්වත්, ගරු ආණ්ඩුකාරතුමන්ගෙන්වත් මේ සඳහා කිසිදු අනුමැතියක් ලැබී නොමැති බවත්, ඒ වගේ ම මෙම කඩ කාමර 16 ට අදාළ ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ සභා අරමුදලින් ද රජය මගින් ද වෙනත් ආධාර මගින් ද කියා අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා විමසා සිටින ලදී.

එහිදී මෙය නාගරික සංවර්ධන අධිකාරිය මගින් රජය ආධාර මත සිදු කර ඇති ඉදිකිරීමක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, මෙම චක්‍රලේඛනයේ 3 වන කරුණට අදාළව පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉවත් කර එම ස්ථානයේ ම රජයේ ආධාර මුදල් වලින් හෝ සභාවේ අරමුදල් වලින් නව වෙළඳපලක් ඉදිකර ඇති අවස්ථාවකදී පැරණි වෙළඳපළේ සිටි බදුකරුවන්ගේ ඉල්ලීමක් වෙතොත් ඔවුන්ට නව වෙළඳපළේ කඩ කාමර ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව හෝ පළාත්

පාලන සේවයට අයත් තක්සේරුකරුවෙකු ආයතනයේ සිටී නම් ඔහුගේ තක්සේරුව හෝ සලකා බලා තීරණය කරනු ලබන වාර්ෂික බදු තක්සේරු කළ බදු කුළිය මත වෙන් කර දිය හැකි බවට සඳහන්ව ඇති බැවින්, මෙම කඩ කාමර පැරණි වෙළඳුන්ට ම ලබාදිය හැකි බවට අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

මෙවැනි කාරණාවන් සම්බන්ධයෙන් අනුමැතිය සඳහා ඉහළට යැවීමේදී මුලින් ම යොමු කරන්නේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත වන අතර, ඊට අදාළ චක්‍රලේඛයක් මගින් හෝ වෙනත් ලියකියවිල්ලක් මගින් සහකාර කොමසාරිස්තුමන්ට විසඳුමක් ලබා දීමේ හැකියාවක් පවතින්නේ නම් ඉන් ඉදිරියට එම ලිපිය නොයවා අදාළ ලිය කියවිලි සමග එය ක්‍රියාත්මක කළ හැකි ආකාරය දන්වා නැවත අප වෙත ම එවන බව ගරු සභාපතිතුමා පැහැදිලි කර සිටින ලදී.

මේ ආකාරයට මෙම චක්‍රලේඛයන්ට අනුව මෙහි සිටි පැරණි වෙළඳුන් 16 දෙනාටම මෙම නව කඩ කාමර ලබාදීමේදී ඉදිරියේදී නීතිමය වශයෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇති වන්නේ ද යන්න ප්‍රදීප් විතානගේ ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී.

මෙම කඩ කාමර 16 පැරණි වෙළඳුන් 16 දෙනාට ම ලබාදීම සුදුසු බවට මෙයින් කියවෙන බැවින් කිසිම දිනක මේ සඳහා නීතිමය වශයෙන් ගැටළු සහගත තත්ත්වයක් හෝ කිසිම සභිකවරයෙකුට අධි භාරයක් නොවන බවත්, තමාගේ සේවා කාලය තුළ කිසිම කෙනකුට අධි භාරයක් වීමට තමන් ඉඩ නොතබන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉන් අනතුරුව අදාළ චක්‍රලේඛයන් හා ලිපිවලට අදාළව මෙහි පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේදී ඉන් ඉවත් කරන ලද බදුකරුවන් හට ම ඊට අදාළ නව ගොඩනැගිල්ලේ කඩ කාමර විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ලබාදීම සුදුසු බවට සභාවේ බහුතරයකගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

එමෙන් ම නව තොග පොළ භූමියේ මෙතෙක් මුදල් ගෙවා නොමැති බදුකරුවන් සිටී නම් ලිඛිතව ඔවුන් දැනුවත් කර මෙම මස අවසන් වීමට පෙර කඩිනමින් අදාළ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමත් එම කාල සීමාවට පසුවත් නොගෙවන බදුකරුවන් සම්බන්ධව ඉදිරියේදී සභා තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාවේ බහුතරයක් දෙනා තීරණය කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල නගරය ආසන්නයේ ඇති මො/විපුලානන්ද මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාංගණය පසු ගිය වැසි සමයේදී දැඩි ලෙස සෝදා පාළුවට ලක්ව ඇති බැවින් එය නැවත සකස් කර දෙන ලෙස එම විදුහලේ විදුහල්පතිවරයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පළාත් සභාව හරහා පාසල්වල සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල මුදල් වෙන් කරන බැවින් අදාළ තැන්වලට දැනුම් දී ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලෙස විදුහල්පතිතුමාට දන්වා යැවීම සුදුසු බවත්, මේ සඳහා සභාව සතු JCB යන්ත්‍රය යොදවා පැය 02 ක පමණ කාලයක් තුළ සිදු කිරිමට අවශ්‍ය කටයුත්තක් ඇතිනම් එය ඉටු කරදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 04**

ග්‍රාමීය හා පාසල් ක්‍රිඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හරහා සමස්ථ දිවයින ම ආවරණය වන පරිදි ග්‍රාමීය ක්‍රිඩා පිටි 335 ක් සංවර්ධනය කිරිමේ ජාතික වැඩසටහන යටතේ මොනරාගල ප්‍රාදේශිය සභාවට අයත් විහාරමුල්ල වසමේ සාප්පුවත්ත ක්‍රිඩා පිටියේ සංවර්ධනය කිරිමට අදාළව වොලිබෝල් ක්‍රිඩා පිටිය ඉදිකිරිම සඳහා රු.ලක්ෂ පහළොවක ප්‍රතිපාදන ලබා දෙන අතර, එයින් රු.30000.00 ක පමණ මුදලක් පරිපාලන වියදම් වශයෙන් ඉවත් වී ඉතිරි මුදල අපට ලැබෙන අතර, මේ සඳහා කාර්මික නිලධාරි මහතා විසින් සකස් කරන ලද රු.1698895.25 ක ඇස්තමේන්තුව කොමසාරිස්තුමන්ගේ අනුමැතියට මේ වන විටත් ඉදිරිපත් කර ඇති අතර, එහිදී එම ඇස්තමේන්තුව නැවත 1698782.95 ක් වශයෙන් කොමසාරිස් කාර්යාලයෙන් සංශෝධනය කර ඇති අතර, මෙම ප්‍රතිපාදන යටතේ මෙම ක්‍රිඩාපිටිය සකස් කිරිමටත් ඒ සඳහා ලැබෙන ප්‍රතිපාදන මුදලට වඩා වැඩියෙන් වැය වන මුදල් සභා අරමුදලින් දැරීමටත් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. මෙම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, අප කාර්මික නිලධාරි විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව කොමසාරිස්තුමන්ගේ අනුමැතියට යවා ඇති බවට මෙහි සඳහන්ව ඇත්තේ අතපසුවීමකින් බවත්, මේ වන විට මෙම ඇස්තමේන්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි වෙත යවා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ස්ථානයට මෙසේ ක්‍රිඩා පිටියක් ඉදිකිරිම කාලෝචිත වශයෙන් වටිනා ක්‍රියාවක් බැවින්, නිසි ක්‍රමවේදයන්ට හා නිසි අධීක්ෂණයන්ට යටත්ව මෙම කටයුතු අදාළ ප්‍රතිපාදනවලට යටත්ව නිවැරදිව සිදු කිරිම සුදුසු බවටත්, මේ සඳහා වෙන් කරන ප්‍රතිපාදනවලට අමතරව වැය වන මුදල් සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 05**

2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවීම් අතපසුවීම් මගින් හා නිසි පරිදි බිල්පත් නොලැබීම හේතුවෙන් ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පහත සඳහන් ජල සේවාවන් වෙනුවෙන් හිඟ මුදල් ගෙවීමට ඇති බව විෂය නිලධාරි විසින් ජාතික ජල සම්පාදන මණ්ඩලයත් සමග කරන ලද නිරීක්ෂණයකදී තහවුරු කරගෙන ඇති බැවින්, අනිවාර්යයෙන් ම ගෙවීමට සිදුව ඇති මෙම හිඟ මුදල් පහත සඳහන් පරිදි සභා අරමුදලින් ගෙවීම් කිරිම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

| ගිණුම් අංකය | ජල සේවාව | හිඟ මුදල රු. |
|---|---|---|
| 40/03/075/460/12 | නව බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය | 59,802.22 |

| | | |
|---|---|---|
| 40/03/075/117/19 | නව බස් නැවතුම්පොළ පොදු ජල කරාමය | 66,114.00 |
| 40/03/125/252/17 | මොනරාගල නව පොළ භූමිය | 10,801.44 |

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙසේ හිඟ බිල් ලැබීම සම්බන්ධයෙන් සභාව කරුණු විමසා සිටි අතර, එහිදී දැඩි නියං සහිත කාලවලදී නගර ආශ්‍රිත ජනතාව නගරයට පැමිණ සභාව සතු ජල කරාමවලින් ජලය බොහෝ සෙයින් රැගෙන යන අතර, සමහර අවස්ථාවන්වලදී මේවා සඳහා ලැබෙන බිල් මුරකරුවන් විසින් ළඟ තබා ගෙන තිබීම නිසා නිසි වේලාවට ආයතනයට බිල්පත් නොලැබී යාම ද මෙයට හේත්වී ඇති බව ගරු සභාපතිතුමා විසින් සඳහන් කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම හිඟ බිල්පත් ඉතා කඩිනමින් ගෙවා නිම කිරීම සුදුසු බවත්, මින් ඉදිරියට කළට වේලාවට අදාළ බිල්පත් ලබා ගෙන ගෙවීම් කටයුතු අතපසුවීමකින් තොරව සිදු කිරීම සුදුසු බවටත් මහ සභාව තීරණය කරන ලදී.

**යෝජනා අංක 06**

දැරණියගල, මාළිගාතැන්න, පොල්වත්ත හි පවත්වාගෙන යනු ලබන SAVINRO CLEANING SERVICE ආයතනයට, මොනරාගල දිස්ත්‍රික්කය තුළ ඉන්සිනේටර් යන්ත්‍රයක් ( මෙම යන්ත්‍රය මගින් සායනික අපද්‍රව්‍ය ප්ලාස්ටික් පොලිතින් වැනි දෑ $1200c^0$ යටතේ දහනය සිදු කරනු ලබයි) සවි කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් අනුමැතිය ලබාදී ඇති බවත්, නමුත් ඒ සඳහා සුදුසු ඉඩමක් නොමැති බැවින්, අප සභාව විසින් කසල කළමණාකරණය කරනු ලබන ස්ථානයෙන් ඉඩම් කොටසක් ලබා දෙන ලෙස එම ආයතනය අප වෙතින් ඉල්ලීමක් කර ඇති අතර එය සභාවට කුළී ගෙවීමේ පදනම මත ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්ව ලබා ගැනීමට ඔවුන් එකඟතාවය පළ කර ඇති අතර එසේ ඉඩම් කොටසක් ලබාදුන් පසු මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් එකතු කරනු ලබන පොලිතීන් ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය නොමිලයේ දහනය කර දෙන බවත්, සඳහන් කරමින් ඉහත ආයතනයේ සභාපතිතුමන් විසින් කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කසල දහනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉන්සිනේටර් යන්ත්‍රයක් සවි කිරීම සඳහා අවස්ථාව ලබාදීම කාලෝචිත වශයෙන් අත්‍යාවශ්‍ය වැදගත් ක්‍රියාවක් වන අතර මෙමගින් මොනරාගලට විශාල

සේවාවක් ද සිදුවන අතර, සභාව මගින් එකතු කරන පොලිතීන්, ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය නොමිලේ දහනය කර දෙන බවටත් සායනික අපද්‍රව්‍ය පවා මෙමගින් දහනය කිරීමට හැකි බවටත් ඔවුන් සඳහන් කර ඇති බැවින්, මේ සඳහා මොනරාගල ප්‍රාදේශිය සභාවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විවිධ අවසර පත්‍රය යටතේ ලබාදී ඇති, දැනට කසල බැහැර කරන හොරොම්බුව, දරගොඩ ස්ථානයෙන් පර්චස් 20 ක ඉඩම් කොටසක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව ඔවුන් සමග සාකච්ඡා කර සභාවට ගෙවිය හැකි මාසික කුළී මුදල ද ඔවුන්ගෙන් ම තීරණයක් ගෙන එයට අදාළව නිසි ක්‍රමවේදයන්ට යටත්ව මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීම වෙනුවෙන් ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 07**

මොණරාගල හුලංදාව විගණන කාර්යාලයට යන මාර්ගයේ ගමන් කිරීමට නොහැකි අබලන් තත්ත්වයේ පවතින බැවින් එය සකස් කරදෙන ලෙස අවස්ථාවන් ගණනකදීම අප වෙතින් ඉල්ලුම් කර තිබුණද එය සකස් කර දීමට නොහැකි වූ බැවින් මෙය සභා අරමුදලින් සකස් කිරීම සඳහා මේ වන විට සභාවේ කාර්මික නිලධාරී මහතා යොදවා අදාල ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම ඇස්තමේන්තු ප්‍රකාරව මෙම මාර්ගය සකස් කිරීම සඳහා රු.450,000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දරා සකස් කර දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතාගේ අධීක්ෂණය යටතේ නිසි ක්‍රමවේදයන්ට යටත්ව අදාළ ඇස්තමේන්තු ප්‍රකාරව සභා අරමුදල් යටතේ මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 08**

ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන කුඹුක්කන පුස්තකාලය සඳහා උපදෙස් හා තොරතුර නිරතුරුවම හුවමාරු කර ගැනීමට අවශ්‍ය වන නිසා පුස්තකාලය සඳහා දුරකථන පහසුකම් හා මෙම ස්ථානයට ඉතා අත්‍යාවශ්‍ය වන වැසිකිළි පද්ධතියක් ඉදිකර දෙන ලෙසට පුස්තකාල භාර නිලධාරී මහත්මිය විසින් කිහිප අවස්ථාවකදීම ඉල්ලුම් කර ඇති නිසා එම ස්ථානය වෙනුවෙන් මෙම පහසුකම් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

මෙම ඉල්ලීම හා සම්බන්ධව සලකා බැලීමේදී මෙම අවශ්‍යතාවයන් එම ස්ථානයට ලබාදීම අවශ්‍ය බැවින්, නිසි ක්‍රමවේදයන්ට යටත්ව දුරකථන පහසුකම් ලබාදීම හා වැසිකිළි පද්ධතියක් ඉදිකර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06.ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.03.01 දින සිට 2021.03.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

නැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

### 8.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මොනරාගල දිස්ත්‍රික්කය තුළ පවත්වා ගෙන යනු ලබන සතොස ව්‍යාපාරික ස්ථාන කිහිපයක ම මත් පැන් අලෙවි කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන බවටත් එය ලබා ගැනිමට සතොස ව්‍යාපාරිකයින් උනන්දු වන බවටත් තොරතුරු ලැබී ඇති අතර, විශේෂයෙන් ම මොනරාගල නගරයේ අළුතින් ඉදිවන මෙගා සතොස හරහා ද මත්පැන් අලෙවි කිරීමේ කුටියක් ආරම්භ කිරීමට අවශ්‍ය බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවට දැන ගැනීමට ඇති අතර, ප්‍රදේශ කිහිපියක ම හුවමාරු වන ප්‍රසිද්ධ පිවිසුම් මාර්ගයක් වන මොනරාගල නගරයේ මෙම නව සතොස ආරම්භ වන අතර, ඒ ආසන්නයේ ම පූජනිය බුදු පිළිමයක් සහිත බෝධින් වහන්සේ නමක් වැඩ සිටින අතර, අන්‍යාගමික බැතිමතුන්ගේ පල්ලිය, දේවස්ථානය මෙන් ම නගරයේ ප්‍රධාන ජාතික පාසලට හුවමාරු වන ස්ථානයක් වශයෙන් පැවතීම නිසා මෙම සතොස වෙළඳසැල මගින් මත්පැන් අලෙවි කිරීම ඉතාමත් නුසුදුසු කාර්යයක් වන අතර, මේ සඳහා තමන් තදින්ම විරුද්ධ වන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, මේ සඳහා මැදිහත්වී මෙය නවත්වාලීමට ඉතා කඩිනමින් කටයුතු කළ යුතු බවට ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම ගරු ජනාධිපතිතුමන්ගේ වැඩ පිළිවෙළකට අනුව පසුගිය අවුරුදු සමයේ සමෘද්ධිලාභී අඩු ආදායම් පවුල් සඳහා විධිමත් වැඩපිළිවෙලක් යටතේ රුපියල් 5000/=ක මුදලක් ලබාදීම සිදු කර ගෙන ගිය අතර, මෙම කටයුතු සඳහා යොදවා තිබූ රජයේ නිලධාරින් මෙම අවස්ථාවන්වලදී අදාළ ජනතාව ඉතාමත් අපහසුතාවයන්ට පත් කරවමින් රස්තියාදු කරවමින් මෙම මුදල් ලබාදීම සිදු කර ගෙන යන බවට ජනතාව විසින් ම තොරතුරු ලබාදී ඇති අතර, මෙම මුදල් ලබාදීමේදී සිදු කරනු ලබන නිර්ණායකයන් මොනවා ද යන්න හරි හැටි නොදන්නා නිසා ජනතාව අසන ප්‍රශ්නවලට නිසි පිළිතුරක් ලබා දීමට නොහැකිව අප මහත් අපහසුතාවයට පත්වන බවට ප්‍රකාශ කර සිටි අතර, රජය විසින් සත් භාවයකින් යුක්තව ජනතාවට ලබා දෙන සහන බෙදා දිමේදි අදාළ නිලධාරින් විසින් විශාල අඩුපාඩු සිදු කරන බවත්, එමගින් රජය අපහසුතාවයට පත්වන බවත්, විශේෂයෙන් ම සභාව හරහා මේ සම්බන්ධව ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාට දැනුම් දීමක් සිදු කර මේ සඳහා පත් කර ඇති කමිටුවල සිටින නිලධාරින් දැනුවත් කිරිමක් සිදු කර අදාළ නිර්නායකයන් හඳුන්වාදී නිසි උපදේශ ඔවුන් වෙත ලබාදි මේ කටයුත්ත ඉතාමත් සර්ව සාධාරණව ජනතාව අපහසුතාවයට පත් නොකර නිසි වැඩ පිළිවෙලක් යටතේ ලබාදිමට කටයුතු කිරිම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම විවිධ අවස්ථාවලදී යම් යම් පිරිස් විසින් ජන සමාජය තුල විවිධ මාතෘකා ඔස්සේ ජන සමාජය තුළ යම් යම් ගැටළුකාරි තත්ත්වයන් ඇති කරවන අතර, ඇස් දෙකෙන් නොදැක තවකෙක් කියන පලියට කතා කරනාට වඩා යම් දෙයක යථාර්ථය හොඳින් අවබෝධ කරගෙන එය සමාජ ගතකරනවා නම් මෙසේ ගැටළුකාරි තත්ත්වයන් ඇති නොවන අතර, ඒ හරහා හැම දෙනාට ම පොදු එකඟතාවයන්ට පැමිණිම තුළ අපහසුතාවයකින් තොරව නිවැරදි තීන්දු තිරණ ගත හැකි බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් පසුගිය සභා වාර්තාවේ තමන් විසින් ප්‍රකාශයට පත් කළ කාරණාවන් කිහිපයක් සභා වාර්තාවට ඇතුළත් වී නොමැති බැවින් එය සංශෝධනය විය යුතු බවට ප්‍රකාශයක් කළ අතර, සභිකවරයෙකු විසින් සභා වාරයේදී ප්‍රකාශ කරන කරුණු සියල්ල ම සභා වාර්තාවට ඇතුළත් කළ නොහැකි අතර, එහි අවශ්‍යම කරුණු සමග සංෂිප්තයක් පමණක් සකස් කළ යුතු බවත්, අදාළ පුහුණු වැඩසටහන්වලදී උපදෙස් ලබාදී ඇත්තේ ඒ ආකාරයට බැවින් මේ සම්බන්ධව කවුරුත් අවබෝධ කරගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- සුරා සැල් සම්බන්ධව කතා කිරීමේදී මේ වන විට සුරා සැල් ඉදිරිපිට ඉදන් බෝතල් ඇරගෙන බීම නතර කර ඇති අතර, මීට පෙර ද නගරයේ ඇති සුරා සැල් කිහිපයක් ම වසා දැමීමට තමන් මැදිහත් වුවත්, එය සාර්ථක නොවුණු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, විශේෂයෙන් ම නගරයේ ඉදිවන නව සතොස ව්‍යාපාරික ස්ථානයට ඉතා ආසන්නව ප්‍රධාන පසල, පන්සල, ඇතුළු පූජනීය ස්ථාන කිහිපයක් ම පිහිටා ඇති ස්ථානයක් බැවින් මේ සඳහා ප්‍රාදේශිය සභාවක් වශයෙන් අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම රජය විසින් අවුරුදු සමය තුළ ජනතාව වෙනුවෙන් රු.5000/= ක මුදලක් ලබා දෙන අතර, මේ සඳහා හිමිකම් ලබන්නේ අඩු ආදායම්ලාභි සමෘද්ධිලාභි පවුල් සහ සමෘද්ධියට හිමිකම් ඇති පොරොත්තු ලේඛනයේ සිටින අයටත්, ආබාධිත අයටත්, මහජන ආධාර ගන්නා වයස අවුරුදු 70 වෙන් පහළ රු.2000/= ක දීමනාව ගන්නා අයත් හිමිකම් ලබන බව ගරු සභාපතිතුමා

ප්‍රකාශ කර සිටි අතර, නමුත් මුලින්ම මුදල් එවා ඇත්තේ සමෘද්ධිලාභින්ට බවත් යම් අයෙකුට මෙම නිර්ණායකයන්ට යටත්ව අසාධාරණයක් සිදුව ඇත්නම් අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ මුදල ලබා ගත හැකි බවට ප්‍රාදේශිය ලේකම් උපදෙස් ලබාදී ඇති බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේම සභා රැස්වීම් අවස්ථාවකදී සභිකවරුන් අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධව මීට පෙර අවස්ථා ගණනකදීම සභිකවරුන් දැනුවත් කර ඇති අතර, වෙනත් කමිටුවලදී හෝ පාර්ලිමේන්තුවේදී කතා කළ යුතු දේවල් මෙම ස්ථානයේ කතා කිරීම එලක් නොවන අතර, එකම කරුණ සෑම සභිකවරයෙකුම කතා නොකර සිටීමටත් වග බලා ගන්නා ලෙසටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, සභා වාර්තාවක් සකස් කිරීමේදී අත්‍යාවශ්‍ය ම වැදගත් කරුණු ගොනු කර සංක්ෂිප්ත වාර්තාවක් අවසානයේදී සකස් විය යුතු බැවින්, සභිකවරුන් ප්‍රකාශ කරන සියළුම දේ අකුරක් නෑර මෙහි ඇතුළත් නොකරන බව අවබෝධයට ගන්නා ලෙසත් ප්‍රකාශ කර සිටින ලදී.

## 8.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සනත් ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මේ වන විට නැවත අවධානයට අඩුවෙන් යොමුවී ඇති කරුණක් වශයෙන් අනවසර මත්පැන්, මත්කුඩු සම්බන්ධව අද වන විට දැඩිව අවධානය යොමු කළ යුතුව ඇති බැවින්, මේ වන විට මාගන්දනමුල්ල, සිරිගල, වැලියාය බටුගම්මන ප්‍රදේශවල ඇති අතුරු මාර්ගවල සිටින තරුණ පිරිස් විසින් මේ සඳහා දැඩි ලෙස ඇබ්බැහි වෙමින් පවතින බවට තමාට තොරතුරු දැන ගැනීමට ඇති බවත්, විශේෂයෙන් ම ළඟදී දිනයක සිරිගල 5 වන පටුමඟ හි යම් ස්ථානයක කුඩු පැකට්ටුවක් තිබී හමු වීමෙන් ගම්මුන්ගේ සහ මොනරාගල මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමන්ගේ මැදිහත්වීමෙන් අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදු කළ බවත්, ඒ වගේ ම මදුරුකැටිය ප්‍රදේශයෙන් ද මේ සම්බන්ධව දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමේදී ඔවුන් ළඟ තිබී කුඩු පැකට් තබන ස්ථාන 10 ක් ලකුණු කරන ලද සිතියමක් හමුවී ඇති අතර, මේ සම්බන්ධයෙන් කටයුතු කළ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමන් ඇතුළු පිරිසටත් දූෂණ මර්ධන ඒකකයේ වැටලීම් අංශයේ සියළුම නිලධාරින්ටත් ස්තුතිය පුද කර සිටින බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, මේ සඳහා ප්‍රදේශයේ බොහෝ තරුණ පිරිස් හා පාසල් දරුවන් මේ සඳහා ඇබ්බැහි වෙමින් පවතින අතර, ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි සියළු දෙනා ම මෙයට මැදිහත් වී මේ සම්බන්ධ කරුණු සොයා බලා ඊට යොමු වී ඇති දරුවන්ගේ දෙව්පියන් මුණ ගැසී සාකච්ඡා කර පුනරුත්ථාපන කඳවුරුවලට මේ දරුවන් යොමු කිරීමේ වැඩ පිළිවෙලක් සිදු කර අපේ ප්‍රදේශයේ දරුවන් මෙයින් මුදවා ගැනීමට කඩිනමින් කටයුතු කරමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම මොනරාගල නගරයේ ස්ථාපිත කිරීමට නියමිත සතොස ව්‍යාපාරය හරහා මත්පැන් අලෙවිසැලක් ස්ථාපිත වෙනවා නම් එය කිසි සේත්ම එම ස්ථානයට නුසුදුසු බැවින්, තමන් හදවතින්ම ඒ දෙයට විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින බවත්, ඒ වගේ ම ප්‍රදේශයේ ජනතාවට මත්පැන් ගැනීමට ඇති තරම් වෙළඳසැල් තිබියදී පූජනීය වටිනාකමක් ගෙන දෙන ස්ථානයක් හා නගරයේ ප්‍රධාන පාසලට ළඟයින් හුවමාරු වන ස්ථානයක මෙවන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට කිසිසේත් ම ඉඩ සලසා දීම වැළැක්විය යුතු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- අනවසර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නැවත වතාවක් හිස ඔසවන බවක් පෙන්නුම් කරන අතර, නමුත් පොලීසිය නිරතුරුව මැදිහත්වී අවශ්‍ය කටයුතු සිදු කරන බවත්, අදාළ දරුවන් පුනරුත්ථාපන කඳවුරුවලට යොමු කිරිමට අපි හැමෝ ම මැදිහත්වී අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරමු බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

- නගරයේ අළුතින් ස්ථාපිත වීමට නියමිත සතොස මධ්‍යස්ථානය හරහා මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරිම සම්බන්ධව රටේ ප්‍රධානින් දැනුවත් නොමැති බවත් මෙම ව්‍යාපාරය සඳහා බාර් පර්මිට් එකක් නොමැති අතර, පර්මිට් ඇති කෙනකු පිටතින් ගෙන්වා ගෙන මෙය සිදු කිරිමට යන බවට තොරතුරු ලැබී ඇති අතර, කෙසේ නමුත් අපි සියළු දෙනා ම මෙය නතර කිරිමට පියවර ගනිමු  බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව පසු ගිය මස තමාට මුහුණ දීමට සිදු වූ කොරෝනා රෝගය හමුවේදී තමාට රෝගය වැලදී ඇති බවට ඇති වූ සැකය මත ඒ මොහොතේ ම අදාළ පරීක්ෂණ සිදු කර ගැනීම සඳහා තමන් සිරිගල රෝහලට ගිය අවස්ථාවේදී අදාළ වෛද්‍යවරයාට රෝග ලක්ෂණ හෙළි කර ඊට අදාළ පරීක්ෂණ සිදු කර ගත යුතු බවට තමන් දැනුම් දුන්න ද එම වෛද්‍යවරයා විසින් එය ප්‍රතික්ෂේප කරමින් බෙහෙත් තුන්ඩුවක් ලියා දී තමාට ගෙදර යන ලෙස දැනුම් දුන් අතර අවසානයේදී තමන් විසින් කිහිප අවස්ථාවක්ම බල කර සිටි නිසා රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණය සිදු කළ අතර එහිදී තමන් රෝගියෙකු බවට හඳුනා ගත් අතර එදිනම තමන් සමඟ එසේ සැක සහිතව රෝහලට පැමිණ සිටි තවත් කිහිප දෙනෙකුටම මෙම පරීක්ෂණය සිදු කරනු ලැබුවේ ඔවුන්ගේ පෙරැත්ත කිරීම මත වන අතර එහිදී ඒ කිහිප දෙනෙකුද රෝගීන් බවට හඳුනා ගැනීම තුළ තව දුරටත් අපගෙන් රෝගය සමාජ ගත වීම වලක්වා ගැනීමට හැකි වුවද මේ භාරව රෝහල තුළදී අදාළ වෛද්‍යවරයා හමු වීමට පෙර සිදු කළ යුතු අනෙකුත් සියලු ක්‍රමවේදයන් අදාළ නිළධාරීන් මැනවින් ඉටු කර දුන්නත් එසේ කටයුතු කළ එම වෛද්‍යවරයා සම්බන්ධව දැඩි කණගාටුව ප්‍රකාශ කර සිටින අතර දැඩි අවධානම් තත්ත්වයක් තිබියදීත් මෙම වෛද්‍යවරුන් මෙසේ කටයුතු කරන්නේ මන්ද යන්න සිතා ගැනීමටවත් නොහැකි බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.  ඒ වගේම මෙසේ තමන් රෝගියෙක් බවට පත් වූ මොහොතේ සිටම සුව වන තෙක්ම තමන්ට උදව් උපකාර කළ සහ ආශිර්වාද කළ සියලු දෙනාටත් සිරිගල රෝහලේදී මෙන්ම හම්බන්තොට මහ රෝහලේ නිරෝධායන මධ්‍යස්ථානයේදී සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කළ සියලුම කාර්යය මණ්ඩලයටත් බෙහෙවින්ම ස්තූතිය පුද කර සිටින බවටත් ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම ප්‍රදේශයේ කොරෝනා රෝග ලක්ෂණ ඇති අය හෝ එම රෝගීන් ආශ්‍රිතයින්ගේ සිදුකරනු ලබන PCR පරීක්ෂණවල වාර්තාවන් පැමිණීම සඳහා වැඩි කාලයක් ගත වීම අවධානම් තත්ත්වයක් වන අතර මේ වන විට මොනරාගල ප්‍රදේශයේ වැඩි වශයෙන්ද රෝගීන් හමු වීම නිසා මොනරාගල මහ රෝහලට PCR යන්ත්‍රයක් තිබීම කාලීන වශයෙන් ඉතාමත් දැඩි අවශ්‍යතාවයක් බැවින් ප්‍රාදේශීය සභාවක් වශයෙන් මේ සඳහා මැදිහත් විය යුතු බැවින් ඉහල දේශපාලන බලධාරීන් දැනුවත් කර මොනරාගල මහ රෝහලට PCR යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු සලසා දෙමු ලෙසට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම සිරිගල මහ රෝහලේ ප්‍රසව හා නාරිවේද මාතෘ සායනය මේ වන විට මාස දෙකක පමණ කාලයක සිට නතර කර දමා ඇති බවට තමන්ට තොරතුරු ලැබී ඇති බවත් දිනකට ගැබිණි මව්වරුන් 100 ක් පමණ පරීක්ෂා කළ මෙම සායනය මෙසේ නතර කර දමා අදාළ වෛද්‍යවරුන් විසින් තම පෞද්ගලික මධ්‍යස්ථානවලදී පමණක් මව්වරු පරීක්ෂා කිරීම සිදුවන අතර මෙමගින් ප්‍රදේශයේ අහිංසක බොහෝ මව්වරුන් පිරිසක් අසරණභාවයට පත්ව ඇති අතර, මේ වන විට මෙම රෝහල මෙසේ විනාශවීම සඳහා රෝහල් වෛද්‍ය අධිකාරීවරයා සම්පූර්ණයෙන්ම වග කිව යුතු බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. මොනරාගල නගරයේ ආරම්භවීමට යන සතොස ව්‍යාපාරය කාලෝචිත වශයෙන් ඉතා වටිනා ක්‍රියාවක් වුවද මේ හරහා මත් පැන් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කර සිටින අතර මෙම ස්ථානයට කෙසේවත් නොගැලපෙන මෙම මත් පැන් වෙළඳාම නතර කිරීමට අප සැම දෙනාම මැදිහත්ව වහාම පියවර ගත යුතු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- සිරිගල රෝහලේ පවතින ගැටලු හා අඩු පාඩු සමබන්ධයෙන් ජනතාවට සිදුවන අසාධාරණකම් සැම සභාවාරයකදීම පාහේ ක්‍රිශාන්ත මන්ත්‍රීතුමන් ඉතා කණගාටුවෙන් යුතුව කතා කරන අතර ඒ සම්බන්ධව අපට කළ හැකි දෙයක් වේනම් සියලු දෙනාම මැදිහත් වී අවශ්‍ය කටයුතු කරමු බවත්, නගරයේ ආරම්භ කිරීමට යන මත් පැන් අලෙවි සැලද නතර කිරීමට කටයතු කරමු බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.උපුල් මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව උත්තරීතර සභාවක ගෞරවණීයව ගනු ලබන සභා තීරණ කවදත් වලංගු වන අතර, පසුගිය මාසයක මොනරාගල සභාවට අයත් නව වෙළඳපොළ කඩ කාමර 16 ටෙන්ඩර් කිරීම සුදුසු බවට සභාව තීරණය කළ ද එම සභා තීරණය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් වෙත දන්වා යැවීමෙන් අනතුරුව තමන් ද ඒ සම්බන්ධව කොමසාරිස්තුමාගෙන් කරුණු විමසා සිටියදී මෙම පැහැදිලි නැති චක්‍රලේඛය තමාට ද පෙන්වා සිටි අතර, එහිදී එතුමන් විසින් ද පවසා සිටියේ සභාවෙන් එවන ලද සභා තීරණය එතරම් පැහැදිලි නොමැති බවත් අදාළ චක්‍රලේඛය සභාවට එවූ පසු ඒ සම්බන්ධව නැවත මහ සභාවේ සාකච්ඡා කර නැවත පැහැදිලි තීරණයක් සභාවෙන් ගන්නා ලෙසට උපදෙස් ලබාදුන් බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ඒ වගේ ම කොමසාරිස්තුමන් විසින් එවා ඇති ලිපියේ ද පැහැදිලිව ම ඒ බව සඳහන් කර ඇති අතර, පැහැදිලි ටෙන්ඩරයක් මගින් මෙම කඩ කාමර 16 ටෙන්ඩර් කර සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම සභා වාර්තාවේ යම් කිසි පුංචි සංශෝධනයක් ගෙන ආ විට ඒ සඳහා ඇහුම්කන්දී එය සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීම අප හට කරන ගෞරවයක් බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී. මහජන නියෝජිතයෙකු වශයෙන් නිරතුරුවම ජනතාවගේ ප්‍රශ්න හඳුනා ගෙන ඒවාට උදව් උපකාර කර, ඔවුන්ට වැඩ කිරීමට අප කවුරුත් බැදී සිටින බැවින් අපගේ ග්‍රාම සේවා වසම්වල බොහෝ අහිංසක ජනතාවක් දෛනිකව යම් යම් ගොවි නිෂ්පාදන මාර්ග දෙපස තබා වෙළඳාම් කටයුතු කරන අතර, ඒ අතරින් තමා හඳුනන දෙදෙනෙකු ස්වයං රැකියාවක් කිරීමට ඉතාමත් කැමැත්තෙන් සිටින බවත් ඒ දෙදෙනාගේ

එම ස්වයං රැකියා කටයුතු සාර්ථක කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියා ඉතා ගෞරවාන්විතව ආයාචනාවක් කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

III. ඒ වගේ ම මහින්ද චින්තනය යටතේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීමට මවබිම ආරක්ෂා කර දී දැවැන්ත ලෙස රට සංවර්ධනය කළ නායකයෙකු වශයෙන් රට තුළ සතොස ව්‍යාපාරය නඟා සිටුවීමටත් ඒ යටතේ ජනතාවට සහනදායි මිල ගණන් යටතේ බඩු භාණ්ඩ ලබා ගැනීමට අවස්ථාව ලබා දුන් අතර, මොනරාගල නගරයේ අළුතින් ඉදිවීමට යන මෙගා සතොස ව්‍යාපාරය හරහා මත්පැන් අලෙවි කිරීම වෙනුවෙන් දැඩි විරෝධය පළ කර සිටින අතර, සතොස හරහා අහිංසක ජනතාවට අවශ්‍ය වන්නේ අඩු මිල ගණන් යටතේ අත්‍යාවශ්‍ය බඩු භාණ්ඩ මිලදී ගැනීම මිස මත් ද්‍රව්‍ය මිලදී ගැනීම නොවන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම දුප්පත් අඩු ආදායම්ලාභි ජනතාව වෙනුවෙන් අවුරුදු සමය තුළ රු. 5000/= ක දීමනාවක් ලබාදී ඔවුන්ට යම් අයුරකින් හෝ සහනයක් සලසා දීමට ගරු ජනාධිපතිතුමන් මෙන් ම ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ගනු ලැබූ ඒ වැඩ පිළිවෙළ සඳහාත් එය සාර්ථක කර ගැනීමට මේ මුදල් ජනතාවට බෙදා දීමේදී සහයෝගය ලබා දුන් සියළුම නිලධාරින්ටත් විශේෂ ස්තුතිය හා ගෞරවය පුද කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ඒ වගේ ම ප්‍රදේශයේ වසම්වල ජනතාවට ගමන් කිරීමට අපහසු අතුරු මාර්ග බොහෝමයක් ඇති බැවින් ඒ සම්බන්ධව සොයා බලා එම මාර්ග සකස් කර දීම සම්බන්ධව අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ද ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- කඩ ටෙන්ඩර් කිරීම සම්බන්ධව කොමසාරිස්තුමන් විසින් අප වෙත එවා ඇති චක්‍රලේඛය සම්බන්ධව සභාවේ සෑම සභිකවරයෙකු ම මේ වන විට දැනුවත් බවත්, ඒ වගේ ම ප්‍රදේශයේ වෙනත් ව්‍යාපෘති හරහා පසුගිය කාලයේ බොහෝ මාර්ග ප්‍රමාණයක් කාපට් කළ අතර, ඒ සඳහා මැෂින් යොදා මාර්ග කපා ඔවුන්ට අවශ්‍ය සහයෝගය ප්‍රාදේශීය සභාවෙන් ලබා දුන් අතර, එයින් සභාවට ආදායමක් ලැබුණු බවත්, පවතින වැසි සහිත තත්ත්වය නිසාත් අනිකුත් අතුරු මාර්ග කැපීම ප්‍රමාද වුවත් ඉදිරි දිනවලදී මේ සියල්ල ම කපා නිම කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.5 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ගරු මන්ත්‍රීතුමන් විසින් ලැබුවාවූ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද නිදුක්ව නිරෝගීමත්ව ගත කිරීමට සියළු දෙනාට ම සුභාසිරි එක් කරමින් කොරෝනා රෝගයට මුහුණ දුන් ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් රෝගීවූ මොහොතේ මුහුණ දුන් අත්දැකීම් ගැන ප්‍රකාශ කර සිටි අතර, එතුමන්ට අපේ මන්ත්‍රීවරුන් නිරතුරුව ම ශක්තියක් වූ අතර, මේ වන විට ඒ සඳහා මුහුණ දෙන සභා ලේකම්තුමා ඇතුළු ඒ පවුලේ සියළු දෙනාටම ඉක්මන් නිදුක් නිරෝගී සුවය ලැබේවා කියා ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම රජය මගින් ක්‍රියාත්මක වන සතොස ව්‍යාපාරය ජනතාවට ඉතාමත් සමීප දෙයක් වන අතර, නගරයේ අළුතින් ආරම්භ කිරීමට යන සතොස ව්‍යාපාරය හරහා මත්පැන් අලෙවිසැලක් ආරම්භ වීමට යනවා නම් එම පරිසරයට එවැනි ව්‍යාපාරයක් කිසිසේත් ම නොගැළපෙන බැවින්, වගකිව යුතු සියළු පාර්ශවයන් දැනුවත් කර මෙය නතර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නගරයේ ඉදිවීමට යන නව සුරා සැල නතර කිරීමට අපි කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.6 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකරන ලද වර්ෂ ගණනාවකට පසුව රංජිත් මද්දුම බණ්ඩාර ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් නව වෙළඳපොළ කඩ කාමර සහිත ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දුන් අතර, මෙහි මුල් ගල තැබීමේ උත්සවයට පවා එකල විපක්ෂයේ සිටිය ද ගරු සභාපතිතුමන් ද එම අවස්ථාවට සහභාගී කරවා ගැනීමට කටයුතු කළ බවත්, නමුත් පසුගිය දිනක අපව ද දැනුවත් නොකර එහි වැඩ නිම කරන ලද එක් මහලක් විවෘත කිරීම සම්බන්ධව තමන් ඉතා කනගාටු වන අතර, නමුත් කෙසේ හෝ එය විවෘත කිරීම සම්බන්ධව පක්ෂ භේදයකින් තොරව අප ඉතාමත් සතුටු වන අතර, එහි ගෞරවය අප සියළු දෙනාට ම ලැබෙන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම නව වෙළඳපොළේ කඩ කාමර 16 සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් එවා ඇති අදාළ චක්‍රලේඛනයන්ට යටත්ව එහි කලින් සිටි 16 දෙනාට ම ඒවා ලබාදීම සම්බන්ධව අපගේ විරුද්ධත්වයක් නොමැති අතර, මෙහි නීත්‍යානුකූලභාවය මෙන් ම පසු කලකදී නීතිමය වශයෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇති නොවන තැනට ඒ කටයුතු විනි විද භාවයකින් යුක්තව සභාවට ද ආදායමක් ලැබෙනවානම් ඒ සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් නොමැති බවත්, ඒ වගේ ම මෙහි සමූපකාරය සඳහා වෙන් කර තිබූ කඩ කාමරය සඳහා ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධව ද දැන ගැනීමට අවශ්‍ය බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම දිස්ත්‍රික්කයකට එක් ව්‍යාපාරයක් ලෙස නව රජය යටතේ වෙළඳ අමාත්‍යංශය හරහා මෙගා සතොසක් ආරම්භ කිරීමට යන අතර, මොනරාගල නගරයේ ආරම්භ වීමට නියමිත මෙගා සතොස හරහා සියළුම ව්‍යාපාර එක්ව මත්පැන් අලෙවිසැල් පවත්වා ගෙන යාමට ද කටයුතු කර ගෙන යන අතර, ව්‍යාපාර මට්ටමින් කර ගෙන යන දේවල් බැවින් තමන් ඒ සඳහා විරුද්ධ නොවන බවත්, මත්පැන් අවශ්‍ය කෙනා මත්පැන් මිලදී ගන්නා අතර, වෙළඳ ව්‍යාපාර ආරම්භ කිරීමේදී එක් දෙයක් අල්ලා ගෙන ඒ දේට විරුද්ධ වීම අවාසියක් වන අතර, මත්පැන් අලෙවිසැල් පවත්වා ගෙන යාමට පෞද්ගලිකව තමන් අකැමති නමුත් මෙවැනි මහා ව්‍යාපාර නගරයට පැමිණීම සම්බන්ධව තමන් විරුද්ධ නොවන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත් මාධ්‍යවේදීන් සහභාගී නොකරවා ගැනීම කළ යුතු බවට චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවට තොරතුරු ලැබී ඇති බවත් මෙවැනි අසාධාරණ තීන්දු තීරණ ගැනීම අනුමත කළ නොහැකි අතර, නිවැරදිව වැඩ කරනවා නම් මාධ්‍යවේදීන් කැඳවිය යුතු අතර, මාධ්‍යවේදීන්ගේ කටයුතු කර ගෙන යාමේ නිදහස අපි ඔවුන්ට ලබාදීම වගකීමක් වන අතර, මේ සඳහා සොයා බලා අවශ්‍ය කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. බදුල්ල නක්කල මාර්ගයේ 22 කණුව බුදු පිළිමය අසල බෝක්කුවක් ඇති අතර, මෙම ස්ථානය ඉතාමත් පටු වන අතර, සතියකට දින 02 තුනක් ම විශේෂයෙන් බයිසිකල් අනතුරු සිදුවන අතර, ඒ වගේ ම ජල නළ එළීම සඳහා කපා ඇති එම ස්ථානයේ ම කාපට් මාර්ගයට ආසන්නව ඉතා විශාල වලක් ද සකස් වී ඇති බැවින්, මේ සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කර කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VI. ඒ වගේ ම මදුරුකැටිය මාර්ගයේ එක් පැත්තක ජල නළ එළීම සඳහා කාණු කපා තවමත් වසා නොමැතිව පවතින අතර, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත් ඒ වගේ ම රජය මගින් පසුගිය අවුරුදු සමය තුළ ජනතාවට බෙදා දෙනු ලැබූ රු.5000/= ක දීමනාවට අදාළව එම චක්‍රලේඛවලට අනුව සමෘද්ධිලාභීන්, පොරොත්තු ලේඛනයේ සිටින අය, වැඩිහිටි ආධාර ලබා ගන්නා අය, වකුගඩු රෝගීන් හා අබාධිත අයවළුන් මෙම මුදල ලබා ගැනීමට හිමිකම් කියන අතර, ඒ අයට අමතරව අපිට අවශ්‍ය ආකාරයට හිතවත්කම්වලට මෙම මුදල් ලබාදිය නොහැකි බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, එමෙන් ම කොරෝනා වසංගතය හේතුකොට ගෙන සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කළ යුතු වුවත්, ප්‍රදේශයේ බොහෝ රාජ්‍ය ආයතනවලට ජනතාව වැඩක් කර ගැනීමට යාමේදී ඔවුන් ඇතුළට ගෙන අවශ්‍ය කාරණා සොයා බැලීම සිදු කිරිම ඉතාමත් මන්දගාමීව වී ඇති අතර, විශේෂයෙන් ම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත යන ජනතාව ඉතාමත් අපහසුතාවයට පත්ව ඇති අතර, ජනතාවගේ බදු මුදල් වලින් වැටුප් ගෙන ඔවුන්ට අවශ්‍ය සේවාවන් නිසි පරිදි ලබා දිය යුතු බැවින්, ඒ සම්බන්ධව හැම දෙනාගේ ම අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නව කඩ කාමර තවම විවෘත කර නොමැති අතර, ඉදිරි දිනකදී ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන් ගෙන්වා මෙය විවෘත කිරිමට අපේක්ෂා කරන අතර, ඒ සම්බන්ධව සියළුම සභිකවරුන් දැනුවත් කරන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- රුපියල් 5000/= දීමනාව ලබා දීමේදී අදාළ චක්‍රලේඛනයන්ට අනුව තෝරා ගත් යම් පිරිසකට එය ලබාදුන් අතර, මෙවැනි අවස්ථාවන්ට ද කට කතා පතුරුවා මිනිසුන් පෙළඹවීමෙන් අදාළ නිලධාරින් යම් අපහසුතාවයන්ට පත්වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- නක්කල මාර්ගයේ 22 කණුව බෝක්කුව ඇති අදාළ ස්ථානය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට කටයුතු කරන බවත්, ඒ වගේ ම මදුරුකැටිය ජල යෝජනා ක්‍රමය යටතේ මදුරුකැටිය මාර්ගයට කලු ගලේ කෙළවරට ම ජලය ලබා දෙන නිසා මෙම මාර්ගයටත් ගල්වල පාරටත් ජලය ලබා දීමට කටයුතු කරගෙන යන බවත්, ඒ වගේ ම මේ ආණ්ඩුව මගින් මාධ්‍යවේදීන්ට නිදහස ලබාදී ඇති අතර, මේ වන තෙක් කිසිම කමිටුවකට සහභාගී නොවන ලෙසට මාධ්‍යවේදීන්ට සීමා නිකුත් කර නොමැති බව ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.7 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අජිත් අගලකඩ මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මොනරාගල නගරයේ අළුතින් ආරම්භ වීමට යන මත්පැන් අලෙවිසැලට විරුද්ධව අද දින මහ සභාවේ බොහෝ ලෙස සාකච්ඡා කෙරුණු අතර, ඒ සඳහා තමන්ගේ ද දැඩි විරෝධය පළ කර සිටින බවත්, නමුත් කාලය නාස්ති කරමින් මේ සභාව තුළ මෙවැනි දේකට විරුද්ධ වීම කිසිම ප්‍රයෝජනයක් නොමැති අතර, 3/2 බලය, විසිවන සංශෝධනයෙන් වැඩි බලයක් තිබෙන ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ප්‍රාදේශීය සභාවක් වශයෙන් එක් අත්සනකින් හෝ එක් දුරකථන ඇමතුමකින් මෙය නතර කර ගන්න පුළුවන්කම තිබියදීත් එසේ බැරි ගානට මේ සභාව තුළ මෙපමණ කාලයක් මේ සම්බන්ධව සාකච්ඡා කරන ලද්දේ මන්ද යන්න ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය මස මහ සභාවේදී ප්‍රදේශයේ ප්‍රධාන පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම වෙනුවෙන් පවතින අඩුපාඩු සකස් කර ගැනීම සම්බන්ධව තමන් විසින් කළ ප්‍රකාශයට අනුව අදාළ තැන්වලට ලිපි යවා තිබීම සම්බන්ධව ස්තුතිය පුද කර සිටින බවත්, ඒ වගේ ම මීට මාස කිහිපයකට පෙර සභා රැස්වීමකදී ජනතා විමුක්ති පෙරමුණේ අය විසින් පාසල්වල පංති කාමරයක සිටිය යුතු ළමයින් ගණන 45 කට වැඩි නම් නඩුවක් ගොනු කිරිමට යාම මහත් ලැජ්ජාවක් බවට ගරු ක්‍රිශාන්ත මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශයක් කර සිටි අතර, ආණ්ඩු බලයක් පවතින නිසා ලබන වර්ෂයේ සිට මේ ලැජ්ජාව නොවෙන්න මෙම ප්‍රධාන පාසැල්වලට දරුවන් ඇතුළත් කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් දියත් කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම බාර් පර්මිට්, අනවසර මත්පැන්, ගස් කැපීම නතර විය යුතු බවට මේ සභාවේ කොතෙකුත් ප්‍රකාශයන් කළත් පවතින සමාජ ක්‍රමය වෙළඳාමට නිදහස ලබාදී ඇති නිසා මේ සමාජ ආර්ථික ක්‍රමය වෙනස් නොකර මේ දේවල් වෙනස් කිරිමට නොහැකි බව කවුරුත් අවබෝධ කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- නව සතොස හරහා පිට ව්‍යාපාරිකයින්ට වෙළඳ කුටි ලබා දීමට ඔවුන් කටයුතු කරන අතර, මත්පැන් අලෙවිසැලක් එසේ බලපත්‍ර ඇති අයෙකු යොදවා කිරිමට යන අතර, මේ සඳහා රජයෙන් බලපත්‍ර නිකුත් කර නොමැති බැවින්, සභාවේ තීරණයක් ගන්නා ලද බව ඉහළ බලධාරින්ට දන්වා යවමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.
- ඒ වගේ ම වැලියාය පාසල, වැදිකුඹුර පාසල, විපුලානන්ද පාසල, මදුරුකැටිය පාසල ඉදිරියේදී ජාතික පාසල් කිරිමට කටයුතු කර ගෙන යන අතර, ඉන් පසුව මේ දරුවන් ඇතුළත් කර ගැනීමේ තද බදය අඩු වෙන අතර, එහෙත් එක් පංති කාමරයක ළමයින් 45 ක් ගැනීම සිදු කළ හැකි බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා**

ලබන මස සභා රැස්වීම 2021.05.14 වන දින නිවාඩු දිනයක් බැවින්, ඊට පෙර දිනය වන 2021.05.13 වන බ්‍රහස්පතින්දා දිනට යොදා ගමු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටි අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයකින් තොරව එකඟතාවය ලබා දෙන ලදී.

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.30 ට පමණ අවසන් කරන ලදී.

2021.04.19 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ..............................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.